සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය
## නැටුම් (දේශීය) - I

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 03 යි.**

**විශේෂ උපදෙස්:**

සියලු අයදුම්කරුවන් i කොටසේ ප්‍රශ්න 30 ට ම පිළිතුරු සැපයිය යුතුය. එයට අමතරව ii උඩරට නර්තනය හෝ iii පහතරට නර්තනය හෝ iv සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

**සැලකිය යුතුයි:**

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරාගන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද කියවන්න.

### I කොටස

1. තාලය තැබීමට යොදා ගන්නා ඝණ වාද්‍ය භාණ්ඩ වේ.
   1. තාලම්පට, ගැටබෙරය, හක්ගෙඩිය
   2. තාලම්පට, පන්තේරුව, අත්මිණිය
   3. තාලම්පට, බුම්මැඩිය, හක්ගෙඩිය
   4. තාලම්පට, උඩැක්කිය, තලිය

2. ශෝකය නමැති ස්ථායී භාවය හඳුනා ගත හැකි සුවිශේෂී ලක්ෂණය වන්නේ,
   1. වැලපීම, කඳුළු සැලීම, පවන් සැලීම
   2. සුසුම් ලෑම, කඳුළුසැලීම, වැලපීම
   3. වැලපීම, උගුර කට වියළීම, උඩ පැනීම
   4. අතපය අප්‍රාණික වීම, ඔල්වරසන්දීම, හැඬීම

3. ගැටබෙරයේ බෙර ඇසෙහි ප්‍රමාණය දැක්වෙන සාම්ප්‍රදායික මිනුම් ක්‍රමය වන්නේ
   1. වියනකි  2. රියනකි.  3. විග්ගුස්සකි.  4. තුනගුලකි.

4. මෙරට දේවදාසින් සිටි බවත් ඔවුන් නැටුම් ඉදිරිපත් කළ බවත් සඳහන්ව ඇත්තේ,
   1. කොරවක්ගල ලෙන් ලිපියේ ය.
   2. සැස්සේරුව ලෙන් ලිපියේ ය.
   3. පාලමොට්ටෙයි සෙල්ලිපියේ ය.
   4. කාලිංග වනෝද්‍යාන සෙල්ලිපියෙහි ය.

5. කොහොඹා කංකාරියේ දක්නට ලැබෙන ගායනය රහිත නර්තන අංගයකි.
   1. මඩුපුරය  2.ආවැන්දුම  3.කොහොඹා හැල්ල  4. දානපහ

6. උත්තර භාරතයේ දිල්ලිය මූලික කොට ගෙන ප්‍රචලිතව ඇති නර්තන සම්ප්‍රදායකි.
   1. භරත  2.කථක්  3.කථකලි  4. මනිපුරි

7. ස්වභාවික ස්වරූපයෙන් බැහැරව ගීත සංවාද ආදියෙන් සමන්විත නාට්‍ය හඳුන්වන්නේ,

1. ශෛලීගත නාට්‍ය 2.තාත්වික නාට්‍ය 3.ගීත නාට්‍ය 4. මුද්‍රා නාට්‍ය

8. මෙලෙයි යකුන් හා රුප්පා යකුන් පුදනු ලබන්නේ,

1. දෙවොල් මඩුවේදීය. 2.පහන් මඩුවේදීය 3.රටයකුමේදීය. 4.කොහොඹා කංකාරියේදීය.

9. පහතරට නර්තන සම්ප්‍රදායේදී පා සරඹ යනුවෙන් හඳුන්වන සරඹ විශේෂය සබරගමු නර්තන සම්ප්‍රදායේදී හඳුන්වන්නේ,

1. පා සරඹ 2. ගොඩ සරඹ 3. මණ්ඩිපද 4. දොඹින පද

10. ඕනෑම අවනද්ධ භාණ්ඩයක මූලික බෙර අක්ෂර හැඳින්වෙන්නේ,

1. ස්වරාක්ෂර 2. බීජාක්ෂර 3. ගර්භාක්ෂර 4. අණු අක්ෂර

11. සකපෝරුව .................... කර්මාන්තයේ දී භාවිත කරයි.

1. පතල් 2. වඩු 3. මැටි 4. ධීවර

12. සොකරි නාටකය සඳහා වන්නි ප්‍රදේශවල භාවිත කරන වාද්‍ය භාණ්ඩය වන්නේ,

1. දවුල 2. තම්මැට්ටම 3. උඩරට බෙරය 4. උඩැක්කිය

13. ''සිහින් සිනිඳු සළුව පැළඳ විත් උන් මරගන'' මෙය ................ කවියකි.

1. ග්‍රහපන්ති 2. සිරස පාද 3. කඩතුරා 4. ගොයම්

14. පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයේදී ආතත හා විතත භාණ්ඩයට අයත් වන්නේ,

1. රබාන හා තම්මැට්ටමය 2. රබාන හා දවුල ය. 3. ගැටබෙරය හා උඩැක්කිය 4. ගැටබෙරය හා තාලම්පටය

15. වන්නම් හා සිංදු වන්නම් නැටීමේදී යොදා ගන්නේ,

1. තාලානුකූල චලනය 2. රිද්මයානුකූල චලනය 3. ප්‍රකාශනාත්මක චලනය 4. සංචාරි චලනය

16. මහ තනිතිතට අයත් වන්නම් වේ.

1. සිංහරාජ වන්නම / අනුරාග දණ්ඩ තාලය/ විරාඩි වන්නම 2. සැවුලා වන්නම / තාතිලිංචි තාලය / මණ්ඩුක වන්නම

3. තුරඟා වන්නම / ශුද්ධ තාලය / කොවුලා වන්නම 4. හනුමා වන්නම / හවාදි තාලය / තිසරා වන්නම

17. උඩරට වන්නම් රචනා කොට ඇත්තේ දකුණු ඉන්දියාවේ නාගපට්ට නම් ප්‍රදේශයෙන් ගෙන්වා ගත් ............. නම් පඬිවරයා විසින් බව කියයි.

1. භරත 2. දප්පුල 3. ගණිතාලංකාර 4. භරතමුණි.

18. දෙවුන්දර දේවාලයේ පන්සියයක් පමණ හින්දු බාලිකාවන් නර්තයේ යෙදුන බවට වාර්තා කර ඇත්තේ,

1. ස්පිල් බර්ජන් 2. ඉබ්න් බතුතා 3. රොබට් නොක්ස් 4. පාහියන්

19. නොඇදෙන අකුරු හෙවත් තනි අකුරු හඳුන්වන්නේ,

1. ලඝු අක්ෂර 2. ගුරු අක්ෂර 3. ප්ලුත අක්ෂර 4. මාත්‍රා අක්ෂර

20. සොකරි රංග භූමියෙහි දක්නට ලැබෙන සැරසිලි වේ.

1. වෙස් අත්ත වංගෙඩිය 2. වෙස් අත්ත, අඹ අත්ත

3. වංගෙඩිය පහන් පැළ 4. වෙස් අත්ත ලන්තෑරුම

21. බෙර වාදනයෙන් තොරව කටින් පද කියමින් අභ්‍යාස කරනු ලබන්නේ,

1. පා සරඹ, ගොඩ සරඹ 2. පා සරඹ, ඉලංගම් සරඹ 3. පා සරඹ, මණ්ඩි පද 4. පා සරඹ දොඹින පද

22. කාලිංග උද්‍යාන සිංහාසන ලිපිය කරවා ඇත්තේ,

1. පඬුවස්දෙව් රජතුමා ය. 2. ශ්‍රී පරාක්‍රමබාහු රජතුමා ය.
3. භාතිකාභය රජතුමා ය. 4. නිශ්ශංක මල්ල රජතුමා ය.

23. සම්ප්‍රදායන් තුනටම අයත් වන්නම්වල යෙදෙන්නකි.

1. තානම 2. කස්තිරම 3. සීරුමාරුව 4. ඉරට්ටිය

24. ශාරීරික ස්වස්ථතාව යනු,

1. ශාරීරික සෞඛ්‍ය නිසි පරිදි පවත්වා ගැනීම 2. ශරීර අවයව හා ඉන්ද්‍රිය පිළිබඳව ඉගෙනීම
3. ව්‍යායාමවල යෙදීම 4. ලෙඩ රෝග පරීක්ෂා කරවා ගැනීම

25. කථක් නර්තනයට මුස්ලිම් ආභාෂය ලැබෙන්නේ,

1. ගුප්ත අධිරාජ්‍ය සමයේ ය. 2. මෝගල් අධිරාජ්‍ය සමයේ ය.
3. පල්ලව අධිරාජ්‍ය සමයේ ය. 4. අශෝක අධිරාජ්‍ය සමයේ ය.

26. ''හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්'' යන ගීතය,

1. විදුර නාට්‍යයේ ගීතයකි. 2. සිරිසඟබෝ නාට්‍යයේ ගීතයකි.
3. බෙරහඬ නාට්‍යයේ ගීතයකි. 4. මනමේ නාට්‍යයේ ගීතයකි.

27. එකැස් බෙරය යනුවෙන් හඳුන්වන්නේ,

1. උඩැක්කිය 2. තම්මැට්ටම 3. දඬුබෙරය 4. රබාන

28. සම්ප්‍රදායිකව බෙර සරඹ හෙවත් හස්ත සාධන අභ්‍යාස ................ කි.

1). 10 2). 12 3). 8 4). 6

29. මෙම රූපයෙන් දක්වෙන්නේ



1. බෙන්තර ගලපාත විහාරයේ දක්වෙන රූකමකි.
2. ඇම්බැක්කේ දේවාලයේ දක්වෙන රූකමකි.
3. ගඩලාදෙණි විහාරයේ දක්වෙන රූකමකි.
4. යාපහුව මාළිගයේ දක්වෙන රූකමකි.

30. දළදා වහන්සේ වෙනුවෙන් කෙරෙන විශේෂිත බෙර වාදනයක් වේ.

1. ගමන් හේවිසි, පූජා හේවිසි 2. ශබ්ද හේවිසි, හැන්දෑ හේවිසි
3. අඹරා හේවිසි, ගෙවැදුම් හේවිසි 4. මැදියම් හේවිසි, ගමන් හේවිසි

---

## II කොටස - උඩරට නර්තනය

31. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේදී පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වේ.

1. කොහොඹා දෙවි, බණ්ඩාර දෙවි, වීරමුණ්ඩ දෙවි 2. පත්තිනි දෙවි, දෙවොල් දෙවි, වාහල් දෙවි
3. කොහොඹා දෙවි, දොළහ දෙවි, පත්තිනි දෙවි 4. පත්තිනි දෙවි, සමන් දෙවි, විෂ්ණු දෙවි

32. යක් ඇනුම, ආවැන්දුම නම් විශේෂ නර්තන අංග දැකිය හැකි වන්නේ,

1. සබරගමු ගම්මඩුවේදී 2. උඩරට කොහොඹා කංකාරියේදී
3. පහතරට දෙවොල් මඩුවේදී 4. උඩරට පහන් මඩුවේදී

33. මාත්‍රා 4තනි තිතට අයත් බෙර පදයකි.

1. දො දොංත තකුදොං
2. දොං ජිංත ගත දොංත
3. ජිංගත ගොගො
4. දෝං ජිං ජිං තකට දොංතකු

34. ''තත් තත් තන්කඩ තරිකිට ... යනුවෙන් සතර බීජාක්ෂර මුල් කරගත් කස්තිරම දක්නට ලැබෙන්නේ,

1. 9 වන ගොඩ සරඹයේදී
2. සිංහරාජ වන්නමේදී
3. 11 වන ගොඩ සරඹයේදී
4. 12 වන ගොඩ සරඹයේදී

35. ''තාම් දොමිති ........., ......... කඩතක තරිකිට ....... දොමිති ගත ....... කුඳ කුඳ'' අඩව්ව සම්පූර්ණ කිරීමට අවශ්‍ය පද කොටස් වන්නේ,

1. දොමිකිට, ගත කිත්තත්, කිතක
2. ගත දොමිකිට කිතක කිත්තක්
3. තකරොං, ගත, කිත්තත්, කිතක
4. කුඳ කුඳ කිත්තත් කිතක

36. උඩරට නර්තනය වඩාත් ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,

1. සත් කෝරළය, කුකුළු කෝරළය
2. සත් කෝරළය, රයිගම් කෝරළය
3. සත් කෝරළය, සතර කෝරළය
4. සත් කෝරළය, මැදගම් කෝරළය

37. මේවා ගැටබෙරයට අයත් කොටස් වේ.

1. කැපුම් හම, සුරත්තට්ටුව, හයිතට්ටුව
2. ඉල්ලම්, කන්වර, වරපට
3. වෙනිවර කැරැල්ල, කැපුමහම, වරපට
4. බෙරකඳ, බෙර පුහුල, ඉල්ලම් මුදු

38. උඩරට නර්නය සඳහා පමණක් භාවිත වචන ඇතුළත් වරණය තෝරන්න.

1. පා සරඹ, ගොඩ සරඹ, සීරුමාරුව
2. ගොඩසරඹ, කස්තිරම, සීරුමාරුව
3. කණ්ඩිලම, කස්තිරම, අඩව්ව
4. ගොඩසරඹ, කලාසම, අඩව්ව

39. ''දොං ජිංත ගත දොංත'' යන බෙරපදයට අදාළ තිත් රූපය වන්නේ,

1. $\hat{1}\ 2\ /\ 1'\ 2\ 3$
2. $\hat{1}\ 2\ /\ 1'\ 2\ 3\ 4$
3. $\hat{1}\ 2\ 3\ /\ 1'\ 2\ 3\ 4$
4. $\hat{1}\ 2\ 3\ 4\ /\ 1'\ 2\ 3$

40. ''සිරිඳුන් පෙර සිටන් බලයුත් සැවතිඳුන්'' මෙම කවිය අයත් වන්නේ,

1. හනුමා වන්නමටයි
2. වෛරොඩි වන්නමටයි
3. තුරඟා වන්නමටයි
4. සැවුලා වන්නමටයි

## III කොටස - පහතරට නර්තනය

31. දෙවොල්මඩු යාගයේදී පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වේ.

1. පත්තිනි දෙවි, දෙවොල් වාහල
2. පත්තිනි, දෙවොල්, කොහොඹා
3. පත්තිනි, සමන්, කතරගම
4. පත්තිනි, විෂ්ණු, වීරමුණි

32. තෙල්මේ නැටීම, වාහල නැටීම නම් විශේෂ නර්තන අංග දැකිය හැක්කේ,

1. උඩරට ගම්මඩුවේදීය
2. පහතරට දෙවොල් මඩුවේදීය
3. සබරගමු දෙවොල් මඩුවේදීය.
4. උඩරට කංකාරි මඩුවේදීය.

33. මාත්‍රා 4 තනි තිතට අයත් බෙර පදයකි.

1. තකදිත් තකදොං
2. ගත්තම් ගත ගුං දං ගත
3. දොම් තම් ගත ගදිතම් ගත
4. ගුංද ගති ගත ගත්ත ගුඳ ගුඳ

34. ගුහිතිග දිරිකිට ගුද ගුද ගුම් දිත්තා
ගහිතිහ දිරිකිටගත ගත ගත් දිත් තා යනුවෙන් නටනු ලබන්නේ,

1. 5 වන ඉලංගම සරඹයේ ඉරට්ටියයි
2. අනුරාග දණ්ඩ තාලයේ ඉරට්ටියයි
3. 12 වන ඉලංගම් සරඹ පදයයි
4. 10 වන ඉලංගම් සරඹ පදයයි

35. තක දිත් ..... ..... තිත් තත් කිට්තක ..... දිකුදං ..... දොමිත ගත ඉරට්ටිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය පද කොටස් වන්නේ,

1. තත්, ජිං, ගත, කිටිතක
2. තක, දොං, තරිගත, දොමිත
3. තත්, දිමි, ගුහිතිග, දිරිකිට
4. දොමි, තම් තරිගත, ජිංගත

36. පහතරට නර්තනය වඩාත් ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,

1. මාතර, ගම්පහ, කෑගල්ල
2. ගාල්ල, මාතර, මාවනැල්ල
3. මාතර, බෙන්තර, රයිගම
4. ගාල්ල, රයිගම, කුරුණෑගල

37. මේවා පහතරට බෙරයේ කොටස්ය.

1. සුරත් තට්ටුව, වෙනිවර, හයිතට්ටුව
2. ගැට්වැල, හඬඉර, වරමුදු
3. වරපට, කැපුම්හම, හයිතට්ටුව
4. ඉල්ලම, හයිතට්ටුව, සුරත්තට්ටුව

38. පහතරට නර්තන සම්ප්‍රදායේ පමණක් භාවිත වන වචන ඇතුළත් වරණය තෝරන්න.

1. සුරල, සරල කවිතාල, අඩව්ව
2. ඉලංගම් සරඹ, ඉරට්ටිය, අත්තාඩිය
3. ඉලංගම් සරඹ, අඩව්ව, කලාසම
4. අත්තාඩිය, සුරල, මාත්‍රා පද

39. 'ගුං දෙගත ගත්ත ගුද

1. $\hat{1}\ 2\ /\ 1'\ 2\ 3$
2. $\hat{1}\ 2\ /\ 1'\ 2\ 3\ 4$
3. $\hat{1}\ 2\ 3\ /\ 1'\ 2\ 3\ 4$
4. $\hat{1}\ 2\ 3\ /\ 1'\ 2\ 3$

40. ''තාරගනා මැදිනා දිසි සුඹුකරා ලෙස සොමි ගුණෙනා'' මෙම කවිය අයත් වන්නේ,

1. ශුද්ධ තාලයට
2. නාතිලිංචි තාලයට
3. කොණ්ඩනාවෙච්චි තාලයට
4. අනුරාග දණ්ඩ තාලයට

---

## IV **කොටස - සබරගමු නර්තනය**

31. පහන් මඩු ශාන්තිකර්මයේදී පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වේ.

1. පත්තිනි දෙවොල්, සමන්
2. පත්තිනි, වීරමුණ්ඩ, කඩවර
3. පත්තිනි, බණ්ඩාර දෙවි, වාහල දෙවි
4. පත්තිනි, ගම්භාර, වීරමුණ්ඩ දෙවි

32. මුදුන් තාලය, දේවකෝල් පාඩුව නම් විශේෂ නර්තන අංග දැකිය හැක්කේ,

1. උඩරට ගම්මඩුවේදීය
2. සබරගමු පහන් මඩුවේදීය
3. උඩරට කොහොඹා කංකාරියේදී 4. පහතරට දෙවොල් මඩුවේදීය

33. මාත්‍රා 4 තනි තිතට අයත් බෙර පදයකි.

1. ජිමිත කුදා දොං
2. දොං දොංත ගදි තිකට ගදිත දො දොං තා
3. දොං දොං ගත ගත් දිත් තක
4. ජිං ගතත් ගතත් ගත කුද

34. ''තිරිකිට දිරිකිට දිරිකිට තිරිකිට'' මෙය

1. 12 වන මණ්ඩි පදයයි
2. මණ්ඩුක වන්නමේ දවුල් පදයයි
3. 10 වන දොඹින පදයයි
4. 11 වන දොඹින පදයයි.

35. ගත්තකු ........ දොංකඩ තිරිකිට ජිත් තා ....... ගත කුද ....... ගතකුද ........

1. ජිත්තම්, ගජිතකු, තත් තත් දොම්කිට
2. ජිත් තා, දොංකුද, ගත කුද
3. තත්, ජිත්, ජිංතක, තරිකිට
4. දොං, තකු, ගතිතක, තරිකිට

36. සබරගමු නර්තනය වඩාත් ප්‍රචලිත වන්නේ,

1. රත්නපුරය, මහනුවර
2. රත්නපුරය, මාතර
3. බලංගොඩ, රත්නපුරය
4. කහවත්ත බඳුල්ල

37. මේවා සබරගමු දවුලේ කොටස් වේ.

1. වරලණුව, කැපුම් හම, හඬඉර
2. වලයම, හඬඉර, සුරත්තට්ටුව
3. ඉල්ලම, වරලණු, ගැටිවැල
4. වරපට, ගැටිවැල, කැපුම්හම

38. සබරගමු නර්තන සම්ප්‍රදායේ භාවිත වන වචන ඇතුළත් වරණය තෝරන්න.

1. දවුල, තීරුමානම, අඩව්ව,
2. දොඹින පද, මණ්ඩි පද, කලාසම
3. මාත්‍රා පද, යක්පද මාත්‍රය, කණ්ඩිලම
4. තිරුමානම, කලාසම, අඩව්ව

39. ජිං ජිමිත තත් තකට යන බෙර පදයට අදාළ තිත් රූපය වන්නේ,

1. $\hat{1}$ 2 / $\acute{1}$ 2 3
2. $\hat{1}$ 2 3 / $\acute{1}$ 2 3 4
3. $\hat{1}$ 2 3 / $\acute{1}$ 2 3 4
4. $\hat{1}$ 2 3 / $\acute{1}$ 2 3

40. ''අවිය රැගෙන යුධයටආ විලසට'' මෙම කවිය අයත් වන්නේ ........... වන්නමට ය.

1. විරාඩි
2. කොවුලා
3. සැව්ලා
4. මණ්ඩුක

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය

## නර්තනය (දේශීය) - II

**නම/විභාග අංකය :-- .................................................................................. කාලය : පැය 02 යි.**

- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.**

(1) සියලු ප්‍රශ්නවලට සුදුසු පිළිතුර ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

1. තාල සංකල්පයේදී මාත්‍රා දෙකකින් යුත් ඇදෙන අක්ෂර හඳුන්වන්නේ ................ නමිනි.
2. දේශීය නර්තන සම්ප්‍රදායන්ගේ මූලික අංගහාරය .................... නමින් හඳුන්වයි.
3. දෙවොල් බෙරයට ව්‍යවහාර කරනු ලබන තවත් නමක් වන්නේ ................ යි.
4. සොකරි නාටකයේ ප්‍රධාන චරිත දෙක ලෙස සැලකෙන්නේ සොකරි සහ ............... යි.
5. භරත නාට්‍ය සම්ප්‍රදායේ දැනට ඇති නර්තන අංග අනුපිළිවෙලට සකස් කරන ලද්දේ ............. සහෝදරයින් සිවු දෙනා විසිනි.
6. කථක් නර්තනය සම්බන්ධව ග්‍රන්ථ රචනා කොට ඇති රජ කෙනෙකු ලෙස .................... හැඳින්විය හැකිය.
7. කරුණ රසයේ ස්ථායී භාවය වන්නේ ....................... ය.
8. මණ්ඩුක වන්නම අයත් වන්නේ ........ නර්තන සම්ප්‍රදායටය.
9. නර්තන කලාව පිළිබඳ තොරතුරු ලබා ගත හැකි අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් සෙල්ලිපි දෙකක් නම් කරන්න.
   i. අනුරාධපුර ................................
   ii. පොළොන්නරු ..........................
10. ආගමික සිද්ධස්ථානයන්හි හේවිසි වාදනය සඳහා යොදා ගන්නා විතාතත වාද්‍ය භාණ්ඩයක් හා සුෂිර වාද්‍ය භාණ්ඩය නම් කරන්න.
    i. විතාතත ................................
    ii. සුෂිර .......................... (ලකුණු 12)

(2) i. සුළු මහ දෙතිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

ii. ''අතට ගෙන රබන් පොඩිය...'' යන කවියේ පේළි දෙකක මාත්‍රා තුනේ (3 + 3) තනි තිතට ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

iii. සිංහරාජ වන්නමේ අඩව්ව හෝ අනුරාගදණ්ඩ තාලයේ ඉරට්ටිය හෝ විරාඩි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

(3) 1. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

1. විල්සන් ඔලබොඩුව ගුරුතුමා හෝ අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා
2. කඩතුරා කවි
3. ශෛලිගත නාට්‍ය
4. වන්නම්
5. අණබෙරය (ලකුණු 3 x 4 =12)

(4) i. නර්තන කලාව පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර හතරක් නම් කරන්න. (ලකුණු 4)

ii. නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බව මහාවංශයෙන් හා චූලවංශයෙන් සාධක එක බැගින් ඇසුරු කර විමසන්න. (ලකුණු 4)

iii. 14 වන සියවසේදී ලංකාවට පැමිණි දේශාටන වාර්තාකරුවෙකු නම් කර එම දේශාටන වාර්තාව පදනම් කොට ගෙන එකල පැවති නර්තන කලාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න. (ලකුණු 4)

(5) i. දේශීය ගැමි නාටක 4 ක් නම් කරන්න. (ලකුණු 4)

ii. සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. සොකරි නාටකයේ බෙරපද හා කවි ගායනා අනුව චරිත නිරූපණය කෙරෙන ආකාරය එක් චරිතයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(6) i. ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩයේ රූප සටහනක් ඇඳ එහි කොටස් හතරක් නම් කරන්න. (ලකුණු 4)

ii. ඉන් නිපදවෙන සතර බීජාක්ෂර නම් කොට එම හඬ නිපදවෙන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. ආගමික කටයුතුවලදී දේශීය වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා ආකාරයපිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 4)

(7) පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



B



C



D



i. A හා B රූපවල ඇති මුද්‍රා නාට්‍ය දෙක නම් කර ඉන් එක් මුද්‍රා නාට්‍යයකට පසුබිම් වූ කතා පුවත කෙටියෙන් ලියන්න. (ලකුණු 04)

ii. ඉන් එක් මුද්‍රා නාට්‍යයක රංග වස්ත්‍රාභරණ හාපසුබිම් අලංකරණ යොදා ගෙන ඇති ආකාරය පහදන්න. (ලකුණු 04)

iii. C හා D පින්තූරවලින් දැක්වෙන නර්තන සම්ප්‍රදායන් දෙක නම් කර ඉන් එක් නර්තන සම්ප්‍රදායක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 10 ශ්‍රේණිය

## නර්තනය - පිළිතුරු පත්‍රය

### I **පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | (2) | 2. | (2) | 3. | (3) | 4. | (3) | 5. | (2) |
| 6. | (2) | 7. | (1) | 8. | (4) | 9. | (3) | 10. | (2) |
| 11. | (3) | 12. | (4) | 13. | (3) | 14. | (1) | 15. | (1) |
| 16. | (1) | 17. | (3) | 18. | (2) | 19. | (1) | 20. | (3) |
| 21. | (3) | 22. | (4) | 23. | (1) | 24 | (1) | 25. | (2) |
| 26. | (3) | 27. | (4) | 28. | (2) | 29. | (2) | 30. | (3) |
| 31. | (1) | 32. | (2) | 33. | (1) | 34. | (4) | 35. | (2) |
| 36. | (3) | 37. | (3) | 38. | (2) | 39. | (1) | 40. | (4) |

### II **පත්‍රය**

01. 1. ගුරු මාත්‍රා/ගුරු
2. මණ්ඩිය / මැණ්ඩිය
3. පහතරට බෙරය /යක්බෙරය/තොවිල් බෙරය/රුහුණු බෙරය
4. ගුරුහාමි / ආඬිගුරු
5. තන්ජාවූර්
6. නවාබ් වලිජ් (වජිඩ්) අලීශා
7. ශෝකය/ශෝක
8. සබරගමු
9. i සැස්සේරුව /කොරවක්ගල
ii පාලමොට්ටායි / කාලිංග උද්‍යාන
10. i දවුල ii හොරණෑව

02. i උඩරට නර්තන සම්ප්‍රදාය

| ^1 | 2 | 1/ | 2 | 3 | 4 | ^1 | 2 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොං | - - | දොං | - | ජිං | - | ජිං | - | ග | ජී | ග | ත |

පහතරට නර්තන සම්ප්‍රදාය

| ^1 | 2 | 1/ | 2 | 3 | 4 | ^1 | 2 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොං | - - | දොං | - | ග | ත | ගත් | - | දිත් | - | ත | කු |

සබරගමු නර්තන සම්ප්‍රදාය

| ^1 | 2 | 1/ | 2 | 3 | 4 | 1 | ^2 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජිං | - | කි | ටි | තත් | -- | තත් | -- | කි | ටි | ත | ක |

විභාගකර දැක්වීම හා සංකේත සඳහා - ල. 02 / බෙරපදය ප්‍රස්තාර කිරීමට ල. 02
(අදාළ තිත් රූපයට බෙර පදයක් ප්‍රස්තාරකර තිබේ නම්)

ii.

| 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | අත | ක | ට | ගෙ | න | ර | බන් | - | පො | ඩි | ය |
| + | වය | ති | දි | සි | රු | වින් | - | - | - | - | - |
| + | ගත | පි | ට | බ | ඳ | සො | ල | වා | - | සි | ලි |
| + | සිලි | න | ද | ක | ර | මින් | - | - | - | - | - |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා ලකුණු 02 යි.
ප්‍රස්තාර කිරීමට සඳහා ලකුණු 02 යි.

iii. සිංහරාජ වන්නමේ අඩව්ව

| 1/ | 2 | 3 | 4 | 1/ | 2 | 3 | 4 | 1/ | 2 | 3 | 4 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තාම් | - | - | දො | මි | ති | ග | ත | දො | මි | කි | ට | කඩ | තක | තරි | කිට |
| කි | ත | ක | දො | මි | ති | ග | ත | කිත් | - | තත් | - | කු | ද | කු | ද |
| තා | - | කු | ජිත් | - | ත | ග | ත | දො | ම් | කි | ට | තරි | කිට | කුං | දත් |
| තා | - | | | | | | | | | | | | | | |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා ලකුණු 02 යි. ප්‍රස්තාර කිරීමට ලකුණු 02 යි.

අනුරාග දණ්ඩ තාලයේ ඉරට්ටිය

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ත | ක | දිත් | - | ත | ක | දොම් | - | කිත් | - | තත් | - | කි | ටි | ත | ක |
| ත | රි | ග | ත | දි | කු | දම් | - | දොම් | - | ත | දොම් | - | ත | ග | ත |
| ත | කු | තත් | - | ගුහි | තිග | දිරි | කිට | තා | - | | | | | | |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා ලකුණු 02 යි.ප්‍රස්තාර කිරීමට ලකුණු 02 යි.

iv. විරාඩි වන්නමේ අඩව්ව

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගත් | - | ත | කු | ජිත් | - | තත් | - | දොං | කඩ | තරි | කිට | ජිත් | - | තත් | - |
| දොං | - | කු | ද | ග | ත | කු | ද | තත් | කඩ | ජික් | කඩ | දොං | කඩ | තරි | කිට |
| දොං | - | ත | දොං | - | ත | ග | ත | ග | ති | ග | ත | දිමි | කිට | තරි | කිට |
| තා | - | - | ජි | මිත් | - | තත් | - | ග | ති | ග | ත | හර් | ජිත් | ගත | කුද |
| තා | - | | | | | | | | | | | | | | |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා ලකුණු 02 යි, අඩවුව/ඉරට්ටිය කිරීමට ලකුණු 02 යි.

**3. (අ) විල්සන් ඔලබොඩුව ගුරුතුමා**

* පහතරට සම්ප්‍රදායේ රයිගම් ශෛලිය ප්‍රගුණ කළ නර්තන හා වාදන ශිල්පියෙකි.
* උඩරට, පහතරට බෙර වාදනය මෙන් ම පෙර අපර දෙදිග තූර්ය භාණ්ඩ වාදනය කිරීමට දක්ෂතා දැක් වූ අයෙකි.
* 60 දශකයේ රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කරමින් පහතරට නර්තන සම්ප්‍රදාය දියුණු කිරීමට කටයුතු කරන ලදී.
* විධිමත්ව නො පැවති පහතරට නර්තනයේ හස්ත පාද ක්‍රමවත් ව ගොඩනැගීමේ ගෞරවය මෙතුමාට හිමි වේ.
* වත්මනෙහි භාවිතයේ පවතින ශුද්ධ මාත්‍රය නිර්මාණය කිරීම.
* දෙවොල් පද හත හා සුරල් හත ක්‍රමවත් අයුරින් සකස් කිරීම

**අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා**

* උඩරට නර්තන සම්ප්‍රදායේ දක්ෂ නර්තන ශිල්පියෙකි.
* මංගලතිරිය ගුරුතුමාගෙන් නර්තනය හා ගායනය ද කිරිගණිත ගුරුතුමාගෙන් උඩරට නර්තනය ද හැදෑරුවේ ය.
* 1951 බෙන්තොට ගාමිණී විද්‍යාලයේ නැටුම් ගුරුවරයා බවට පත් විය.
* ඉන්දියාවට ගොස් ශ්‍රී ගෝපිනාත් යටතේ කථකලි නැටුම් පිළිබඳ පුහුණුවක් ලැබී ය.
* 1954 බලපිටිය ගුරු විදුහලේ ද 1956 රජයේ ලලිත කලායතනයේ ද කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කරමින් උඩරට නර්තන කලාවට විශාල සේවයක් කළේ ය.
* උඩරට නර්තක සම්ප්‍රදායයේ ශාස්ත්‍රීය නර්තන අංග ඒකාකාරි රටාවෙන් බැහැරකොට ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරීමට දායක විය.

මින් එක් ශිල්පියකු පිළිබඳව කරුණු 04 ක් ලියා ඇත්නම් - (ලකුණු 4)

(2) කඩතුරා කවි

* ශාන්තිකර්ම ගායන විශේෂයකි.
* උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායන් තුනටම අයත් ශාන්තිකර්ම වලදී භාවිතා වේ.
* ශාන්ති කර්මවලදී රංග සැරසිලි ආවරණයට භාවිත කරන සුදු රෙද්ද කඩතුරාව නමින් හඳුන්වන අතර එම ආවරණය ඉවත් කරන්නේ කඩතුරා කවි ගැයීමෙන් පසුව ය.
* බෞද්ධාගමික මුහුණුවරක් ගායනාවල අන්තර්ගතව ඇත. උදා:- ''සිද්ධ මුනිඳු වැඩ හිඳ' බෝ මුල විදුරාසන'' විවිධ නාද මාලා අනුව කඩතුරා කවි ගයයි. ආදී කරුණු 04 ඇත්නම් (ලකුණු 04)

3. ශෛලිගත නාට්‍ය

* ජීවිතයේ එදිනෙදා දක්නට ලැබෙන විවිධ අවස්ථා හා සිද්ධි සැබෑ ස්වරූපයෙන් බැහැරව අතිශෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය ශෛලීගත නාට්‍ය නම් වේ.
* තාලය හා රිද්මය පදනම් කොට ගෙන දෙබස් උච්ඡාරණය ද, නර්තනය ද යොදා ගනී.
* පොතේගුරු විසින් චරිත වේදිකාවට කැඳවන අතර ඊටම ආවේණික ගමන් තාල යොදා ගනිමින් චරිත වේදිකාවට පැමිණෙයි.
* බොහෝ විට මේ සඳහා යොදාගෙන ඇත්තේ අතීත, ඓතිහාසික කතා පුවත් ය.
* ශෛලීගත නාට්‍ය සඳහා උදා:- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ, සිංහබාහු ආදී කරුණු 04 ක් ලියා ඇත්නම් - (ලකුණු 4)

**Answer**

4. වන්නම්

* දේශීය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්තිකර්ම වලින් බැහැර වූ ශාස්ත්‍රීය නර්තන අංගයක් ලෙස වන්නම් හැඳින්විය හැකි ය.
* උඩරට, සබරගමු වන්නම් ගායනය හා විනෝදාස්වාදය මුල් කරගෙන බිහි වී ඇති අතර පහතරට සිංදු වන්නම් ගායනට හා පූජාර්ථය මුල්කොට ගෙන රචනා වී ඇත.
* වන්නම් යනුවෙන් හඳුන්වන්නේ පුද්ගලයකු, සත්වයෙකු යම් ද්‍රව්‍යයක් කල්පිත වස්තුවක්, දෙවිකෙනෙකු පිළිබඳ ව කෙරෙන වර්ණනාවකි.
* උඩරට වන්නම් මහනුවර යුගයේදී ශ්‍රී වීර පරාක්‍රම රජ දවස කවිකාර මඩුවේදී රම්මොලවක අධිකාරම, ගණිතාලංකාර නම් බමුණෙකු හා, මල්වතු විහාරවාසී හිමි නමක් එක්ව රචනා කල බව කියැවේ.
* පහතරට සිංදු වන්නම් දඹදෙණි යුගයේදී කාලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත රජ දවස දා පුළුසෙන් නමැති ප්‍රාදේශීය රජු විසින් සිංදු වන්නම් රචනා කොට උපුල්වන් දේවාලයේ ගායනා කරන ලද බව හා හරන ගණිතයා සිංදු වන්නම් රචනා කොට අන්ධ පුද්ගලයෙකුට දුන් බවත්, ඒවා දෙවියන් ඉදිරියේ ගායනා කිරීමෙන් ඇස් පෙනීම ලැබුණු බව කියැවේ.
* සබරගමු වන්නම් සබරගමු සමන් දේවාලය මුල්කොට ගෙන බිහිවී ඇති බව
* උඩරට වන්නමක බෙරපදය, තානම, කවිය, කස්තිරම සීරුමාරුව අඩව්ව යන කොටස් ද, පහතරට සිංදු වන්නමක බෙර පදය, තානම, කවිය, ඉරට්ටිය යන කොටස් ද, සබරගමු වන්නමක බෙරපදය, තානම, කවිය, කලාසම, අඩව්ව යන කොටස් ද ව්‍යුහය තුළ ඇත. ආදී කරුණු 04 ලියා ඇත්නම් - ලකුණු 4

(4 x 3 = 12)

5. අණබෙර

* රාජ්‍ය පාලන කටයුතුවලදී සන්නිවේදනය සඳහා වාද්‍ය භාණ්ඩ යොදාගත් අවස්ථාවක් ලෙස අණබෙර හැඳින්විය හැකි ය.
* අණබෙර වැයීම යනුවෙන් අදහස් කරන්නේ යම්කිසි රාජඥාවක් දන්වා සිටීම සඳහා ජනතාව රැස් කිරීමට කරන ලද වාදනය.
* මේ සඳහා දවුල යොදා ගනී. ආදී කරුණු 04 ක් ලියා ඇත්නම් ලකුණු 04

4. I. වංශකතා, රූකම්, සෙල්ලිපි, සංදේශ කාව්‍ය, සාහිත්‍ය කෘති, දේශ සංචාරකයින්ගේ වාර්තා ආදී 04 නම් කිරීම - ලකුණු 04

II.
* අනුරාධපුර යුගයේ ආරම්භකයා ලෙස සැලකෙන පණ්ඩුකාභය රජු චිතතරාජ හා කාලවේල යක්ෂයින් සමග සම අසුන්ගෙන තමා ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව.
* දුටුගැමුණු රජු නළඟනන් පිරිවරාගෙන රුවන්වැලි සෑයේ ධාතු නිධන් කිරීමේ උත්සවයට පංචතූර්ය වාදන සහිතව ගිය බව.
වැනි කරුණු මහාවංශයේ සඳහන්ව තිබීමෙන් රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බව එක් කරුණකින් පැහැදිලි කිරීම -
(ලකුණු - 02)
* පරාක්‍රමබාහු රජු නගර නිර්මාණයේදී නාට්‍යශාලා පහක් ඉදිකරන ලද බව.
* නැටුම් ගැයුම් වැයුම් සඳහා සරස්වතී මණ්ඩපය මහා පරාක්‍රමබාහු රජු ඉදි කළ අතර සෙබළුන්ගේ අශ්වාදය පිණිස නැටුම් ගැයුම් කර වූ බව වැනි කරුණු චූල වංශයේ සඳහන්ව තිබීමෙන් රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බව එක් කරුණකින් පැහැදිලි කිරීම. (ලකුණු 02)

III. ඉබන් බතුතා
දෙවිනුවර උපුල්වන් දේවාලයේ මිනිස් ප්‍රමාණ උස දෙවිරුවක් අභියස හින්දු බාලිකාවන් පන්සියයක් ගී ගයා නැටූ බව සඳහන්ව තිබීමෙන් දේවාල ආශ්‍රිතව ආගමික පූජාවන් සඳහා නර්තනය යොදා ගත් බවත්, හින්දු බාලිකාවන් නැටීම තුළින් භාරතීය ආභාසය දැකිය හැකි බවත්, කාන්තා නර්තනය පැවති බව ආදී තොරතුරු ලියා ඇත්නම්
(ලකුණු 04)

05. I. සොකරි, කෝලම්, නාඩගම්, රූකඩ මින් 04 ලියා ඇත්නම් (ලකුණු 04)

II. පූජාර්ථය - සොකරි කතා පුවතට අනුව කතරගම දෙවියන්ට භාරයක් වීමට පැමිණීම, පත්තිනි දෙවියන් ඇදහීම. කවි, ගායනා තුළ අන්තර්ගත වීම. ''සොකරිය රැක දෙන් පත්තිනි අම්මා'' ''සොකරි බාර වුනි පත්තිනි අම්මට'' ආදී කවි පදවලින් හෙලිවන බව
සශ්‍රීකත්වය - සොකරියට දරුවකු ලැබීම තුළ සශ්‍රීකත්වය පෙන්නුම් කරන බව, කමත රඟමඩල කොට ගැනීම තුළ සශ්‍රීකත්වය පෙන්නුම් කිරීම, සොකරි අවසානයේ ගැයෙන ''ගව සම්පත් බෝ වේවා'' ආදී කවි තුළින් සශ්‍රීකත්වය අපේක්ෂා කරන බව ආදී ලෙසින් අරමුණු 2 පැහැදිලි කොට ඇත්නම් (ලකුණු 04)

III සොකරි චරිතය - සොකරිය රූමත් කාන්තාවකි. උඩරට සාම්ප්‍රදායික ඔසරියෙන් සැරසී අතෙහි ලේන්සුවක් හෝ මල් පොකුරක් ගෙන දොං ජිජිගත බෙර පදයට අනුව සභාගත වන බව සරල බස් වහරක් යොදා ගනිමින් සිවුපද ආකෘතියට රචනා කොට ඇති සොකරි කවි තුළින් සොකරියගේ චරිත ලක්ෂණ හෙලිවන බව ''අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී'' වැනි කවි ලියා කරුණු ඉදිරිපත් කිරීම
(මෙලෙස සොකරි නාටකයට අයත් ඕනෑම චරිතයක් පිළිබඳව ලියා ඇත්නම් (ලකුණු 4)

06. I. ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩය ඇද කොටස් 04 නම් කිරීම (ලකුණු 4)

II. උඩරට බෙරය

තත් - බෙරයේ වම් ඇස මැදට පුපුරා යන ලෙස ගැසීමෙන්

ජිත් - බෙරයේ දකුණු ඇසේ ඉහළට ගැසීමෙන්

තොං - බෙරයේ වම් ඇසේ ගැටිය අසලට ඇඟිලි අගින් ගැසීම

නං - බෙරයේ දකුණු ඇසේ ගැටිය අසලට සුළැඟිලි ප්‍රදේශයෙන් ගැසීම.

පහතරට බෙරය

තත් - හයි තට්ටුවට මහපටැඟිල්ල හැර අනෙක් ඇඟිලි 4 වැදීමට සැලැස්වීම

දිත්- සුරල් තට්ටුවේ ගැටියට මහපටැඟිල්ල හැර අනෙක් ඇඟිලි 4 ධ්වනිය විහිදී නොයන ලෙස වැදීමට සැලැස්වීම

තොං- හයි තට්ටුවේ ගැටිය අසලට ගසා හඬ විහිදී යාමට සැලැස්වීම

නං- සුරල් තට්ටුවේ ගැටිය අසලට ගැසීම.

දවුල

තත් - වම් අතින් වම් ඇසට පුපුරා යන ලෙස වාදනය

ජිත් - දකුණු ඇසට දකුණු අතේ ඇඟිලිවලින් පුපුරා යන සේ වාදනය

තොං - වම් ඇසේ ගැටිය අසලට ඇඟිලි වලින් වාදනය වී හඬ විහිදී යාමට සැලැස්වීම

නං- දකුණු ඇසේ ගැටිය අසලට අකුණු අතේ ඇඟිලිවලින් හඬ විහිදී යන ලෙස වාදනය

ඉගෙන ගන්නා සම්ප්‍රදායට අනුව කරුණු ලිවීම (ලකුණු 04)

III. * අතීතයේ සිට ම ස්ථූප පූජා, බෝධි පූජා, දළදා පූජා සඳහා වාද්‍ය භාණ්ඩ යොදාගත් බව

* දවුල, තම්මැට්ටම, හොරණෑව මේ සඳහා වඩාත් යොදා ගත් බව

* හැන්දෑ ධූරය, අළුයම් දුරය, මැදියම් ධූරය වැනි වාදන අංග පැවති බව

* දළදා මාළිගයේ පවත්වන ලද අඹරා හේවිසිය හා ගෙවැදුම් හේවිසිය

* පෙරහැර ආශ්‍රිතව වාදනය යොදා ගැනීම.

* භික්ෂූන් වහන්සේ, දනට, බණට, පිරිතට වඩින විට වාදන අංග යොදා ගැනීම.

වැනි කරුණු 04 පිළිබඳව විමසීම (ලකුණු 04)

07. I A - කරදිය

II B - කුම්භකථා (ලකුණු 04)

* එක් මුද්‍රානාට්‍යයකට අදාළව කතා පුවත කෙටියෙන් දක්වා ඇත්නම්

II කරදිය * සිසි, චන්ද්‍ර හා ධීවර වැසියන් සඳහා ධීවර ජනතාව අඳින ඇඳුම් වලට සමාන ගැමි ඇඳුම් පැළඳුම් නිර්මාණාත්මකව සකසා ඇති බව

* මකුළුවාගේ හා මැස්සන්ගේ රංග වස්ත්‍රාභරණ සඳහා චරිත ලක්ෂණ විදහා දක්වෙන ලෙස භාරතීය ආභාසය ලැබ ඇඳුම් නිර්මාණය කොට ඇති බව

* පසුබිම් අලංකරණය සඳහා ගල්පර පැල්පත් වැටකෙයියා පඳුර වැනි දේ සංකේත මගින් ඉහත දක්වා ඇති බව රංග වස්ත්‍රාභරණ සෝමබන්දු විද්‍යාපති විසින් සකස් කොට ඇති බව

* බටහිර අභාසය රංග වස්ත්‍ර පසුතල සඳහා ලැබී ඇති බව

කුම්භ කතාව - මහේෂ් උමගිලිය විසින් රංග වස්ත්‍ර නිර්මාණය කොට ඇත. කුහුඹුවන්, තණකොළ පෙත්තන්ගේ ඇඳුම්, පැළඳුම් ඉතා විශිෂ්ඨ ලෙස සැබෑ සතුන්ගේ ශරීර වර්ණවලට ගැලපෙන ලෙස වර්ණ යොදමින් සැබෑ සත්ත්ව ස්වරූප ඉස්මතුවන ලෙස සකස් කොට ඇති බව.

(ලකුණු 04)

III C භරත D - කථක්

එක් නර්ථන සම්ප්‍රදායක් තෝරාගෙන ප්‍රචලිත ප්‍රදේශ - සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ නර්තන අංග - දියුණු කළ පුද්ගලයන් ආදී කරුණු 03 ක් ලියා ඇත්නම්

(ලකුණු 04)